# දොරටුවෙන් සැඟවුණු අපූරු ගම්මානය



පිනිති වීරසේකර

# දොරටුවෙන් සැඟවුණු අපූරු ගම්මානය

කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය - 2023 නොවැම්බර්
ISBN 978-624-206-636-3

පිනිති වීරසේකර
5 ශ්‍රේණිය
මහ/මාහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

කර්තෘගේ වෙනත් කෘති
අමාශාගේ පොරොන්දුව * ප්‍රථම මුද්‍රණය * 2019 ඔක්තෝම්බර්
පුංචි අපේ සරුංගලය * ප්‍රථම මුද්‍රණය * 2020 දෙසැම්බර්
සුරංගනා සිහිනය * ප්‍රථම මුද්‍රණය * 2020 දෙසැම්බර්
හා පැංචාගේ උදව්ව * ප්‍රථම මුද්‍රණය * 2020 දෙසැම්බර්

## පිදුම

පුංචි අපට හොඳ නරක සහ අකුරු
කියා දෙන විදුහල්පතිතුමියට සහ
පන්ති භාර ගුරුතුමියට
බැති සිතින් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .
එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.
2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

එකමත් එක ගමක හිටියා ටිකිරියි , සඳුනියි කියලා යාළුවෝ දෙන්නෙක්. දවසක් මේ දෙන්නා මිදුලේ සෙල්ලම් කර කර ඉන්න විට එයාලගේ බෝලය වත්ත පහළට ගියා.



වත්ත පහළට ගිහින් බෝලය සොයන විට එතන තිබුණු ගසක , කඳෙහි පුංචි දොරටුවක් තියෙනවා ටිකිරි දැක්කා.

ටිකිරි ඒ බව සඳුනිට කිව්වා.



ඉන්පසු මේ යාලුවෝ දෙන්නා එතනට ගොස් දොරට තට්ටු කළා. එවිට මේ පුංචි දොර ටිකෙන් ටික විශාල වෙන්න පටන් ගත්තා. මෙයින් බියට පත් සඳුනිත් ටිකිරිත් පස්සට පැන්නා. එවිට දොරටුව ඉබේම විවෘත වෙන්න පටන් ගත්තා.




විවෘත වූ දොරටුවෙන් ඇතුළට ගිය මේ දෙන්නාට
උමගක් හමු වුණා .මේ දෙන්නා උමග දිගේ
ඉදිරියටම ගියා.



එසේ යන විට ඉතා සුන්දර නමුත් අමුතු
ගම්මානයක් ටිකිරිටත් සඳුනිටත් හමු වුණා.






එම ගම්මානයෙහි සිටි කුඩා මිනිසුන් දැක මේ දෙන්නා බියටත් පුදුමයටත් පත්වුණා. මේ කුඩා මිනිසුන් ද, ටිකිරිත්, සඳුනිත් දැක බියට පත්ව එහෙ මෙහෙ දුවන්න පටන් ගත්තා.



"අපි ඔයාලට කරදර කරන්නේ නෑ. ඔයාලා බයවෙන්න එපා." කියලා සඳුනි කිව්වා. එවිට මේ කුඩා මිනිසුන් සඳුනිත් ටිකිරිත් ළඟට ආවා. එවිට ටිකිරි එයාලා මෙහෙට ආව හැටි කිව්වා. ඔයාලත් බයවෙන්න එපා. "අපි ඔයාලව අපේ ගමට සාදරයෙන් පිළිගන්නවා." කියලා ගමේ නායකයා කිව්වා.




"ඔයාලගේ ගම නම් හරිම ලස්සනයි" කියලා සඳුනි කිව්වා. අපි ඔයාලට අපේ ගම පෙන්වන්නම් ඔයාලා ඒකට කැමතිද කියලා එක් කුඩා මිනිසෙක් ඇසුවා. අපි කැමතියි අපි කැමතියි කියා දෙදෙනාම එකවර පිළිතුරු දුන්නා.




"ඔයාලට තියෙන්නේ හතු වලින් සෑදූ ගෙවල් නේද?... ඒවා නම් හරිම ලස්සනයි." කියලා ටිකිරි කිව්වා. තවත් එහි සිටි අමුතු අමුතු සතුන්, අමුතු වාහන , අමුතු පැළෑටි සහ වර්ණවත් මල් ඔවුන් දුටුවා. ලොකු බූට්ස් සපත්තුවක ඇතුළේ තිබූ එයාලගේ ඉස්කෝලය ටිකිරිගේත් සඳුනිගේත් වඩාත්ම සිත් ගත් තැන වුණා.

මේ කුඩා මිනිසුන් ටිකිරිටත් සඳුනිටත් ඔවුන් සතුව තිබූ ඉතා රසවත්ම ආහාරපානවලින් සංග්‍රහ කළා. එම ආහාර රස කර කර කෑ සඳුනිත් ටිකිරිත් කුඩා මිනිසුන්ට ස්තුති කළා.



ගෙදර යාමට සැරසුණු ටිකිරිටත් සඳුනිටත් මේ කුඩා මිනිසුන් වටිනා ඖෂධ පැළෑටි දෙකක් තෑගි කළා. ඒවා ද රැගෙන සතුටින් ගෙදර ගිය සඳුනිත් ටිකිරිත් මේ අපූරු ගමන ගැන පොතක් ලිවීමට අදිටන් කර ගත්තා.





පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01

ISBN 978-624-206-636-3